## අම්මප මාර ලෝකයක් මේක

වීනේ පැත්තට යන්න ගිහින් ආපහු කැරකිලා ඉන්දියන් සාගරය පැත්තට හැරවිලා අතුරුදන් වුණ මැලේසියන් ගුවන්යානයේ කොටසක් අප්‍රිකාව පැත්තෙන් හමුවෙලා කියලා දැන ගත්තට පස්සෙ මේක ලියන්න හිතුණේ. ටික කාලෙකට කලින් යුක්රේනයෙදී කැරළිකාරයෝ වෙඩි තියලා බිම දාපු මැලේසියන් ගුවන් යානයේ මියගිය ඔස්ට්‍රේලියානුවන් වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ



සමුළුවෙදි විදේශ ඇමතිනී ජුලියා බිෂොප් රුසියාවට දෝෂාරෝපණය කළා. ඔස්ට්‍රේලියානුවන් 27 ක් ඇතුළුව යුරෝපා ජාතිකයන් (පෝලන්ත නෙදර්ලන්ත බෙල්ජියම්) 225 කට අධික ප්‍රමාණයක් ගමන් කළ යානය වෙඩි තබා බිම හෙලූ යුක්රේන කැරළිකරුවන්ට එරෙහිව පරීක්ෂණයක් පැවැත්වීම රුසියාව නිශේධ බලය යොදා නවත්තලා තියෙනවා. ඊට විරුද්ධව තමයි ජුලියා හඬ නගලා තියෙන්නෙ.

සද්දෙ විතරයි. වැඩක් නැහැ. රුසියාව ඉස්සරහ ඔස්ට්‍රේලියාවත් ලංකාව වගේ තමයි. බලය විසින් සියල්ල තීරණය කරනු ලබන හැටි. තමාගේ රටේ වැසියන් ඇතුළු සියගාණක් මරා දැමූ මිනීමරුවන්ට එරෙහිව යමක් කරගන්න බැරි මිනිස්සු අප වගේ රටවලට සාධාරණය වෙනුවෙන් - ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැගීම වෙනුවෙන් - බලපෑම් කරනවා. මාරම ලෝකයක් තමා මේක.

අපි හැමදාම හිතන්නෙ අපට තමයි හැමෝම පුප්පන්නෙ කියලා. ඒත් මේ වගේ බලවත් රටවලුත් අසරණ වෙන හැටි දැක්කම තනි ඇහැට කඳුළු කැට එන්නෙ සට සට ගාලා.

## යමක් ගැන අදහසක්

පොතක් ලියන්න පුලුවන් මාතෘකාවක් ගැන මේ වගේ කෙටි සටහනක් ලියන එක අසාධාරණ වුණාත් පසුගිය සතියක අපේ මේ රටේ සිදුවුණ කණගාටුදායක සිද්ධිය නිසා ලිවිය යුතුමයි කියලා හිතුණා. සිටි ඒකේදි ප්‍රජාතන්ත්‍රීය අයිතීන් වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායමකුත් ඊට එරෙහි කණ්ඩායමකුත් ගැටුණ හැටි ඔබත් මාධ්‍ය හරහා දකින්න ඇති.



තමන්ගෙ ආගමික සංස්කෘතික ගති පැවතුම් ආරක්ෂා කරගැනීමත් ඒවා පවත්වාගෙන යාමත් එක කාරණයක්. ඒත් ඒවා නිසාම තමන්ගෙ මව්බිමෙන් වෙන්වෙලා මෙවැනි රටක ඒ රටේ නීතිවලට අනුගත වෙලා ජීවත්වීම යනු තවත් කාරණයක්. චූටි මල්ලි මේ දෙකටම එකඟයි.

ඒත් වවුලගේ මගුල් ගෙදර ආවම ඉන්න වෙන්නෙ එල්ලිලා. ඒක තේරුම් ගත යුතුමයි මූලිකවම. තමන්ගෙ පෞද්ගලික දේවල් ගෙදරදි හෝ තමන්ගෙ ප්‍රජාවටම වෙන්වුණ ස්ථාන වල කර ගත්තාට අවුලක් නැහැ. ඒත් ඒක ගෙඩි පිටින් සමාජයට ගේන්න උත්සාහ කරලා මේ සාමකාමී ජීවන රටාව අවුල් කරන්න හදන්න එපා කියලා අපේ රටේ ජීවත්වන විවිධ ජාතීන්ගෙන් පොදුවේ ඉල්ලා සිටිනවා. මොකද මේවා අමාරුවෙන් ගොඩ නගපු රටවල් නිසා.

කියන්නේ මොකද්ද මොකක් ගැනද කියලා කේරෙනවා ඇතැයි සිතනවා.

## හැදිච්චකම

ක්‍රිකට් ගැන මේ දවස්වල අහන්න බලන්න වෙලා තියෙන්නෙ ප්‍රිය උපදවන තොරතුරු නොවෙයි. ඒ ඉතින් අපේ ක්‍රිකට් වල ස්වභාවයනෙ. ඒත් මම කියන්න හදන්නෙ ක්‍රිකට් ගැනම නොවුණත් ඒහා සම්බන්ධ කාරණා දෙකක් ගැන මගේ අදහසයි. මේක ටිකක් පරණ නිව්ස් එකක් උනත් මේක ගැන නොලිය ඉන්න එක හරි නැහැ වගේ දැනුණා. මොකද



දැන් අපේ කට්ටිය ක්‍රිකට් ගහන ස්ටයිල් එකේ හැටියට මේක රිපීට් වෙයිද කියලා හිතෙනවා. මං කියන්න හදන්නෙ එදා කොළඹ ග්‍රවුන්ඩ් එකේදි පක්කෝ එක්ක මැච් එකේදි අපේ ක්‍රීඩා ලෝලීන් හැසිරුණ විලාසය ගැන.

ලෝකය මෙච්චරකල් අපව අඳුනාගන හිටියෙ බුද්ධිමත් ක්‍රීඩා ලෝලීන් සිටින රටක් විදිහට. දිනුවත් පැරදුණත් ඒක උපේක්ෂාවෙන් දරාගෙන හිටපු ජන කොටසක් අපි. කාටහරි ඕනෙ වෙලා තියෙනවා නම් අපව ඉන්දියන් පකිස්ථාන් ක්‍රීඩා ලෝලීන් ගානට දාන්න ඒකට ඉඩ දෙන්න බැහැ. ඒ තත්වය වැළැක්වීම ක්‍රීඩා අමාත්‍යාංශයේ වගකීමක්. මේවා නියපොත්තෙන් ගලවලා දාන්න ඕනෙ දේවල්. ඒහෙම නොවුණොත් අපි දැන් පරදින ලෙවල් එකේ හැටියට ඔටෝ ම අපේ කට්ටිය ඉන්දියන් පකිස්ථාන් ගානට පත්වෙන්න පුළුවන්.

මේ තත්වය සමනය කරන්න වැඩ පිළිවෙලක් හදන්න ඕනෙ මෙහේ වගේ. ග්‍රවුන්ඩ් වටේ වැටවල් ගහලා හිල් අස්සෙන් මැච් බලන සයිස් එකට ක්‍රීඩා ලෝලීන් දාන්නෙ නැතුව. අපටත් දුකයි තමයි කට්ටය ගැන. මොකද කරන්නේ. හැමදාම අමාවක නෑනේ. මේ වැටෙන උල්කාපාත තරු අස්සේ අපටත් දවසක ක්‍රිකට් හඳක් පායයි. එතකල් කාගෙන ඉමු. අනෙක් කාරණේ තමයි හොඳට කාලාබීලා කන්ට්‍රෝල් නැතුව කරන පිස් සු ජාතිවාදයට හරවන්න (මාධ්‍ය හරහා හෝ ) දරන උත්සාහය අපි පරද්දන්න ඕනෙ.

මම නම් කියන්නෙ කාට හරි ඕනෙ නම් පක්කොන්ට සපෝට් කරන්න ඒකට අපි ඉඩ දිය යුතුයි. දැන් අපි මේ රටේම ඉඳගෙන අපේ අවශ්‍යතා සේරම මේ රටෙන් ඉටුකරවාගෙන පවුල් පිටින් එම්සීජී එකට ගිහින් ලංකාවට චියර් කරන්නෙ. මොකක්ද ඒකෙයි මේකෙයි තියෙන වෙනස. අපි රට ගැන හිතලා එකතු වෙලා චියර් කරනවා. තව කොටසක් ආගම නිසා ඒකම කරනවා. කට්ටියම ගන්නෙ එකම ආතල් එකක්.

අමාරුවෙන් හරි අන්‍ය මතයට ගරු කරන්න උත්සාහ ගමු. රටට තියෙන ආදරේට කටකතා වලට පියාපත් හදලා පියාඹාගෙන යන්න ඉඩ දෙන්න එපා. ඒවා ගිනි පුළිඟු වෙලා ඇවිලේවි. පහුගිය ජූලි මාසේ. ඒකයි මේ කියන්නෙ

## නිහතමානීකම

අවසානයේ ලේබර් එකටත් ඇබට්ගෙ ක්‍රියාමාර්ගයම අනුමත කරන තැනට පත්වෙන්න සිදුවුණා. පක්ෂයකට එවැන් තත්වයකට පත්වෙන්න සිදුවීමත් ඒ පත්වීම ප්‍රායෝගික තලයට ගෙන ඒමට අවශ්‍ය ධෛර්යය තිබීමත් අපි ඉතා අගය කළ යුතු කාරණයක් ලෙසයි චූටි මල්ලි දකින්නෙ.

එහෙම දේවල් අපේ දේශපාලන සංස්කෘතිය තුළ අපට හුරු පුරුදු නැති දේවල්නෙ. අපි හුරු වෙලා තියෙන්නෙ හරි හෝ වැරදි හෝ අනෙකාගේ මතයට හෝ ක්‍රියාමාර්ගයට හෝ එරෙහිව යාමටනෙ. මේක මෙහේ දේශපාලනයේ හරිම වැදගත් මං සන්ධියක්.

චූටි මල්ලි සරණාගතයන් ගැන බොහෝම සානුකම්පිකව බලන කෙනෙක්. මගේ මිත්‍රයන් අතරින් අති බහුතරය මොන ක්‍රමයකින් හරි මේ සංක්‍රමණිකයන් නතර කළ යුතුයි යන මතයේ සිටින අය. ඒ අනුව ඇබට් ඔවුන්ගේ ප්‍රසාදයට පාත්‍රවීම අනිවාර්ය කාරණයක්. මම නම් කියන්නේ අපේ ටැක්ස් මුදල් ගියත් කොහේ යරි දූපතකට යවලා හරි පිළිවෙලකට පරීක්ෂා කරලා මෙහෙට එන්න අවස්ථාවක් දෙන්න ඕනෙ කියලා. දැන් කොහොම හරි ඇබට් ඒක කළා. ලේබර් එක මෙතුවක් ඕක විවේචනය කළත් විකල්පයක් තිබුණේ නැහැ. ඕස්ට්‍රේලියානු ජනතාවටත් හිතට දැනෙන විදිහේ. ඒකට විරුද්ධ වෙනවා නම් ඒකට ගැලපෙන විකල්ප වැඩ පිළිවෙලක් තිබිය යැතුයි. නැත්නම් අකැමැත්තෙන් හෝ කල් පසු වී හරි එයට එකඟ විය යුතුයි. බිල් ෂෝට්න් ඒක කළා. ඒකෙ තියෙන වටිනාම දේ තමයි තමන් මේ තාක්



කල් විවේචනය කළ දේ කල් ගතවී හෝ අනුමත කිරීමට තිබූ ධෛර්යය. නිහතමානීකම. එවැනි දෙයක් කළ හැක්කේ තමන් ගැන නොසිතා ජනතාව ගැන සිතන්නට හැකි නායකයන්ට පමණයි. මහජන මුදල් කාබාසිනියා නොකොට රටත් බේරාගෙන තමුනුත් පක්ෂයත් ගොඩ දා ගැනීමට ලේබර් එකට දැන් හැකිවී තිබෙනවා. ලේබර් එකෙන් මෙරටට ගෙන්වන සංක්‍රමණිකයන්ගේ ප්‍රමාණය ඊට හිලව් වශයෙන් වැඩි කරන බවක් බිල් කියා තිබෙනවා. ඒකට ඉතින් කවුරුත් විරුද්ධ නැහැනෙ.

මේවායේ අපට ගන්න කොපමණ නම් දේවල් තියෙනවද? රටක නායකයෝ උපායශීලීව බුද්ධිමත්ව වැඩකරන්න ඕනේ කොහොමද කියලා මතක් කරන්නයි මේ මැතිවරණ කාලේ මේක සටහන් කළේ.

මං
**චූටි මල්ලි**

# චූටි මල්ලිට ලියමනක්

**හිතාදර චූටි මල්ලී,**

සන්නස මාසික පුවත්පත කියවන්න, මාසෙ මුල එනතුරු නොඉවසිල්ලෙන් බලා ගෙන ඉන්න තරමට පාඨකයො ලංකර ගන්න තරම් චූටි මල්ලිගෙ කණ්ඩායමේ අයියල දක්ෂ වෙලා. ඒ කථාව 'බටර් ගෑමක්' කියල වරදවල නම් හිතන්න එපා.

ජූලි සඟරාවෙ, ඔයාගෙ දහ අට වංගුව පිටුවෙ, 'මං ස්වයං වාරණයක' මැයෙන් ඉදිරිපත් කරපු ඔයාගෙ තීරණයට, අදහසට විරුද්ධව මට හැගෙන දේ කියන්නයි මම අද ලියන්න හිතුවෙ.
කඩ කාරයෙක් හරි පන්සලක් හරි එහෙම නැතිනම් පල්ලියක් කෝවිලක් හරි පත්තරේ පලවෙන යම් අදහසකට, රූපයකට හෝ පාටකට අකමැති නම් හරි විරුද්ධ නම් හරි, ඒ මොන 'අදහස'ටද කියල විමසල බලන එක තමයි මුලින්ම කරන්න තියෙන්නෙ. මුලින්ම බලන්න ඕන පාඨකයන්ගෙ පැත්තනෙ. එක එකාව සතුටු කරන්න වාරණ දගන්න එක නෙවිනෙ. ඒ 'අදහස්' හරිද වැරදිද කියන්න තරම් ඔයාල සන්නස පිරිවර, බුද්ධිමත් සහ එඩිතර බවයි පාඨකයො හැටියට අපි නම්, තේරුම් අරගෙන ඉන්නෙ. ඕනෙ නම් ඒ විරුද්ධ වෙන 'අදහස' ගැන කතිකාවතක් උනත් ඔයාලට ඇරඹිය හැකිනෙ.

අනික චූටි මල්ලි, කඩ කාරයෙක් කොහොම උනත් ඔය අනිත් කියාපු අය නම් ඉතින් කන්නෙ අඳින්නෙ හුගක් වෙලාවට අනුන්ගෙන්මනෙ. ඉන්නෙ උනත් අනුන් නඩත්තු කරන තැන් වලනෙ. අනුන් කිව්වට ඒත් මේ ඔයාල අපිම තමයි. මොකෝ දුක් මහන්සියෙන් වැඩ කරල ආදයම් බදු එහෙම ගෙවන එකක්යැ.
ඉතින් නොගැලපෙන අදහසක් කවුරුහරි අතින් ලියැවිලා කියැවිලා තිබුනොත්, ලියපු කියපු කෙනා සොයාගෙන එයත් එක්ක වැදගත් විදියට කථාබස් කරල ඒක තේරුම් බේරුම් කර ගනීවිනෙ නේද.
හැබැයි ඒ කපටියෙක් තක්කඩියෙක් නොවෙයි නම් විතරයි. පොර, අණ්ඩයෙක් නම්, අර ලංකාවෙ කරන තාලෙට යටින් ගේමක් දෙයි බබා වගේ රඟපාන ගමන්. චූටි මල්ලි උනත් පරෙස්සමෙන් වැඩ කරන්න.

'ස්වයං වාරණ' දගන්නව කියල ඔයාල කරන්නෙ හොරෙකුට තක්කඩියෙකුට නැති නම් බොරු චණ්ඩියෙකුට හරි, එවුන් කණ්ඩායමකට හරි බයේ, කොන්ද පාත් කරගෙන උන්ට ආවඩන එක නම්, ඒක රටට ජාතියට ආගමට විතරක් නෙවි, පාඨකයින්ටත් ඔයාල කරන ලොකු අසාධාරණයක් කියලයි මට හිතෙන්නෙ. ඔයාගෙ සටහනේ අන්තිමට හීනියට මඩ පාරකුත් ගහල තිබුනා, වාරණ නොදමන පත්තර වලටත් නේද. පවු..!
එහෙම වාරණ ඔයාලම දගෙන ඒව සාධාරණීය කරන්න බොරු හේතු පෙන්නන එකත්, එක්තරා විදියක දීන කපටිකමක් වගෙයි මට නම් දැනෙන්නෙ.

ලංකාවෙදි නම් ගස් බඳීවි, දණ ගස්සාවි නැතිනම් සිවිල් ඇඳුම් අන්දවල, අනුන්ගෙ පිස්තෝලයක් දීල, බොරු අංක තහඩු දගත්තු සුදු වෑන් එකකින් රෑකට ආමි කාරයො තුන් හතර දෙනෙක් එවල ගේමක් දේවි කියල වගේ මර බයක් දැනුනට, මෙහේදි ඒවා 'පොයි' නේද චූටි මල්ලී. බය වෙන්න කාරි නැහැ මේ රටේදි අපි. බය නැතිව ඇත්ත කථා කරමු. අපේ තනි නොතනියට මොකා නැති උනත්, අන්තිමට 'සෝෂල් සිකියුරිටි' ඉන්නවනෙ නේද. කාට බය වෙන්නද.

ඔය තක්කඩි ඉන්නව නම් මේ රටෙත් අපි අතරෙ, උන්ව නිරුවත් කරල පෙන්නන එක, රට ජාතිය ආගම තුනටම විතරක් නොවේ මේ ඕස්ට්‍රේලියානු සමාජයටත් වැඩදයක වේවි කියලයි පාඨකයෙක් හැටියට මට හිතෙන්නෙ. ඒ අයව නිවැරදි කර ගන්නයි අපි වැඩ කරන්න ඕන. මම වැරදිද මන්ද. සන්නසේ ජනප්‍රියත්වය ගැන නම් කිසිම විවාදයක් නැහැ. එක තැනකින් එපා කිව්වට චූටි මල්ලි, 'සන්නස' ලබා ගන්න, බෙදන්න තව ඕනෙතරම් තැන් තියෙනවා පාඨකයි න්ට. බය වෙන්න එපා. තවලම ඉදිරියටම ඇදේවි, ඔය පර බල්ලො බිරුවට.

මල්ලිගෙ වචන වලින්ම කියන, 'සමාජ සාධාරණය' ගැන වැඩ කරන්න හිතනව නම් තව ටිකක් නිර්භීතව අපක්ෂපාතී උනොත් තමයි වඩා හොඳ. අවංකව ඇත්ත සන්නසට ලියන්න ඉඩ දෙන්න. පැත්තකට විකරක් ආවඩන්න යන්න එපා. හොරුන්ට කපටින්ට තක්කඩියන්ට වගේම අවස්ථාවාදීන්ට උනත්, ඉඩක් ලැබෙන විදියට වැඩ කරන එක අවම කරන්න මහන්සි ගන්න.

මේක මගේ අදහසයි. ඒක චූටි මල්ලි අනුමත කලත් නොකලත් මට කමක් නැහැ. යුතුකමක් හැටියටයි ලියල එවන්න හිතුවෙ.
බොහොම ස්තුතියි ඉවසිල්ලෙන් මගේ ලිපිය කියවල අදහස තේරුම් ගත්තට.
සන්නසට සුබ පැතුම්.

මම,
සන්නස පාඨකයෙක්.
ආනන්ද ගුණතිලක